**ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය**

# පරීක්ෂක වාර්තාව

**අන්තර්මධ්‍ය විභාගය - ජනවාරි 2014**

## (55) තොරතුරු කළමනාකරණය හා ව්‍යාපාරික භාවිතය
(Information Management & Application in Business)

---

මෙවර ප්‍රශ්න පත්‍රයේ ප්‍රායෝගික කොටස් ඉතා විශාල වශයෙන් අන්තර්ගත වුවත් අයදුම්කරුවන්ගේ ප්‍රායෝගික දැනුම කාලීනව වර්ධනය වී ඇති නිසා නිවැරදි පිළිතුරු තෝරාගෙන ලිවීමට හැකි වී තිබුණි.

## A - කොටස

**බහුවරණ ප්‍රශ්න**

**ප්‍රශ්න අංක 01 - ලකුණු 40**
**(අනිවාර්ය ප්‍රශ්නයකි.)**

පළමු ප්‍රශ්නය සුපුරුදු ලෙස කොටස් 20 කින් සමන්විත බහුවරණ ප්‍රශ්නයකි. මෙම ප්‍රශ්නයට ලකුණු වැඩියෙන් ලබාගත් අයදුම්කරුවන් ඉතා ඉහළ ප්‍රතිශතයක් විය. එම නිසාම ඔවුන් සමත්වීමේ මුළු ලකුණු මට්ටම ට නිරායාසයෙන්ම ළඟා වී තිබුණි. ප්‍රශ්න පත්‍රයම සළකා බලන කල ඉතාමත් ප්‍රයෝගික වූ ප්‍රශ්නවලින් සමන්විතව ඇත. එය ඉතා කාලීන අවශ්‍යතාවයක් බව පෙන්වා දිය හැක. අයදුම්කරුවන් ද ප්‍රයෝගික වශයෙන් තොරතුරු තාක්ෂණය පිළිබඳව මනාව දැනුවත්ව සිටින බැවින් පහසුවෙන් පිළිතුරු සපයා ඇත.

## B - කොටස

**ප්‍රශ්න අංක 02 - ලකුණු 15**
**(තෝරා ගත හැකි ප්‍රශ්නයකි.)**

(a) කොටසේ දත්ත සැකසීම නිර්වචනය කිරිම බලාපොරොත්තු වූ අතර එය සාර්ථකව ලිවීමට අයදුම්කරුවන් වැඩි පිරිසක් සමත්ව තිබෙන නමුත් දෙවන (b) කොටසේදී සමහරක් අයදුම්කරුවන් කොටස් 6 න් කිපයක් පමණක් නිවැරදිව ලියා තිබුණි. නමුත් අයදුම්කරුවන්ගෙන් අඩකට වැඩි පිරිසක් සාර්ථකව පිළිතුරු ලියා ඇත. මෙම වචන තේරුම හරිහැටි තේරුම් නොගත් පිරිසක්ද විය. බොහෝ දෙනෙක් (c) කොටසින් අසා ඇති රූප සටහනක් ඇසුරින් පද්ධති අතර ඇති සම්බන්ධතාවය නිදර්ශනය කෙරෙන ආකාරය පෙන්වීමට සමත් වූ නමුත් මෙම කොටස හරිහැටි තේරුම් ගෙන නොතිබුනු බව පැහැදිලි විය. මන්ද යත් ඔවුන් රූප සටහන වෙනුවට විස්තර කිරීම් පමණක් කර තිබුනි.

ප්‍රශ්නපත්‍රයේ අනෙකුත් ප්‍රශ්න හා සැසඳීමේදී ඉතා පහසු හා ලෙහෙසියෙන් පිළිතුරු ලිවිය හැකි ප්‍රශ්නයක් වූවත් සමහර අයදුම්කරුවන්ට මෙය හරිහැටි පැහැදිලිව තේරුම් ගැනීමට අපහසු වී ඇත. එබැවින් ඔවුන්ගේ පිළිතුරු සාර්ථක නොවූ අතර වැඩි ලකුණු ලබා ගැනීමටද නොහැකි විය. මෙම විෂයට අදාල ස්වඅධ්‍යයන පාඩම් මාලාව අධ්‍යයනය කළ අයදුම්කරුවන්ට ඉතා පහසුවෙන් මෙම ප්‍රශ්නයට පිළිතුරු සපයා ලකුණු ලබා ගැනීමට හැකියාව තිබුණි.

**ප්‍රශ්න අංක 03 - ලකුණු 15**
**(තෝරා ගත හැකි ප්‍රශ්නයකි.)**

මෙම ප්‍රශ්නය කොටස් 3 කින් සමන්විත විය. මෙහි (A) දී අයදුම්කරුවන්ගෙන් බලාපොරොත්තු වී ඇත්තේ මෙහෙයුම් මට්ටමේදී කළමනාකරුවන්ගේ කාර්යයන් පිළිබඳව අවබෝධයක්, (B) මගින් කාර්යාල ස්වයංකරණ පද්ධතියක ක්‍රියාකාරකම් සෘජුව හඳුනාගැනීමත් වේ. අවසාන කොටසින් එනම් (C) මගින් අපේක්ෂා කොට ඇත්තේ න්‍යායාත්මක කරුණු පදනම් කරගෙන බැංකු ණය මුදලක් ඉල්ලා සිටින ගිණුම් හිමියකු සම්බන්ධයෙන් බැංකුව අපේක්ෂා කරන කරුණු පිළිබඳ දළ අවබෝධය පරීක්ෂා කිරීමත් ය.

(a) අයදුම්කරුවන්ගෙන් වැඩි ප්‍රමාණයක් මෙහෙයුම් කළමනාකරුවන්ගේ කාර්යභාරය හඳුනාගෙන ලැයිස්තු ගත කර ඇති අතර වෙන් කර ඇති ලකුණු ප්‍රමාණය (6) ලබා ගැනීමට සමත්වී ඇති බව නිරීක්ෂණය විය.

(b) අයදුම්කරුවන්ගෙන් බොහෝ දෙනා නිවැරදි පිළිතුරු සැපයීමට අසමත් වී ඇත. "කාර්යාල ස්වයංකරණ පද්ධතියක ක්‍රියාකාරකම් හඳුනාගැනීම" යන්න නිවැරදිව අවබෝධ කර ගැනීමට නොහැකි වී ඇති බව නිරීක්ෂණය විය.

(c) අයදුම්කරුවන්ගෙන් බොහෝ දෙනා වෙන් කළ ලකුණු සංඛ්‍යාවෙන් වැඩි ලකුණු ලබාගෙන ඇත. එහෙත් සම්පූර්ණ ලකුණු ලබා ගැනීමට නොහැකි වී තිබුණේ අපේක්ෂිත උපකල්පන පිළිබඳ සඳහන් කිරීමට බොහෝ අයදුම්කරුවන් අපොහසත් වීම නිසාය.

**ප්‍රශ්න අංක 04 - ලකුණු 15**
**(තෝරා ගත හැකි ප්‍රශ්නයකි.)**

අනු කොටස් 4 කින් සමන්විත වේ.

(a) තුන්වන පරම්පරාවේ පරිගණකවල ලක්ෂණ කෙටියෙන් පැහැදිලි කිරීම.

(b) නවීනතම Smart Phones වල Text enter කිරීම සඳහා හඳුන්වා දී ඇති උපාංග පිළිබඳව පැහැදිලි කිරීම.

(c) PC's වල වර්තමානයේ CD Drive එකක් නොමැතිව CD දෘඪ තැටි කියවිය හැකිද යන්න (DVD හඳුන්වාදීමත් සමගම) පිළිබඳව කරුණු දැක්වීම.

(d) අළුතින් ආරම්භ කරන මූල්‍ය සමාගමක පිහිටුවීමට යන CBIS එකක data recover කරගැනීම සඳහා සෑම සේවකයකු හටම Pen Drive එකක් ලබාදීමේ යෝජනාව සඳහා එකඟත්වය සහ විකල්ප යෝජනා ඉදිරිපත් කිරීම.

(a) මෙම කොටස සඳහා තෙවන පරම්පරාවේ පරිගණකවල සුවිශේෂ ලක්ෂණ පැහැදිලි කිරීම වෙනුවට අයදුම්කරුවන් පොදුවේ පරිගණක වල ලක්ෂණ පිළිතුරු ලෙස ඉදිරිපත් කර තිබුණි. (වේගය, පිරිවැය, භාවිතා කිරීමේ ක්‍රම)

(b) කොටස සඳහා බහුතරයක් නිවැරදිව නවීනතම Smart Phones වල අකුරු ඇතළත් කිරීමේ උපාංග පිළිබඳව පහදා තිබුණි.

(c) මෙම කොටසේ ඇතැම් අයදුම්කරුවන් දක්වා තිබුණේ CD Drive නොමැති නම් එය නොහැකි බවය.

(d) මෙම කොටසටද බහුතරය ඉදිරිපත් කර ඇති යෝජනාව අනුමත කර තිබූ අතර විකල්ප යෝජනාවන් පිළිබඳ ප්‍රායෝගික අදහස් ඉදිරිපත් කර නොතිබුණි.

**ප්‍රශ්න අංක 05 - ලකුණු 15**
**(තෝරා ගත හැකි ප්‍රශ්නයකි.)**

මෙම ප්‍රශ්නය කොටස් 4 කින් සමන්විත විය. මෙමගින් (a) සට්ටන මුද්‍රණ යන්ත්‍ර වර්ග 2 ක් සහ සට්ටන නොවන මුද්‍රණ යන්ත්‍ර වර්ග 2 ක් ලැයිස්තු ගත කිරීම, (b) පෞද්ගලික පරිගණක සඳහා වෙළඳපොළෙහි ඇති වෛරස් නාශක මෘදුකාංග 4 ක් ලැයිස්තු ගත කිරීම., (c) වෙළඳපොළෙහි තිබෙන ව්‍යවසාය සම්පත් මෘදුකාංග පැකේජ 03 ක් ලැයිස්තු ගත කිරීම., (d) ගිණුම්කරණ මෘදුකාංගයක් සහ ව්‍යවසාය සම්පත් සැලසුම් මෘදුකාංගයක් අතර වෙනස ආදිය විමසා තිබුණි. බොහෝ අයදුම්කරුවන් මෙම ප්‍රශ්නයට පිළිතුරු දීමෙන් වැළකී සිට බව පෙනුණි.

(a) මෙම ප්‍රශ්නය සඳහා පිළිතුරු සැපයූ අයදුම්කරුවන්ගෙන්ද බහුතරයක් මෙම කොටස සඳහා ලකුණු 4 ම ලබාගෙන තිබුණි.

(b) මෙම කොටසට පිළිතුරු සැපයූ අයදුම්කරුවන් වෙළඳපොළෙහි ඇති වෛරස්නාශක පිළිබඳව ඉතා හොඳින් දැනුවත් වී ඇති බව පෙනේ.

(c) ව්‍යවසාය සම්පත් මෘදුකාංග පිළිබඳ විමසීමේදී බොහෝ දෙනා නිවැරදි පිළිතුරු සපයා සම්පූර්ණ ලකුණු ලබාගැනීමට සමත් විය.

(d) මෙහිදී ගිණුම්කරණ මෘදුකාංග පිළිබඳව ඉතා හොඳින් විස්තර කර ඇතත් ව්‍යවසාය සම්පත් මෘදුකාංග පිළිබඳව එතරම් සාර්ථකව පිළිතුරු සැපයීමට අපොහසත් වී ඇත. වෙනස්කම් ඉදිරිපත් කිරීමේදී ඒ පිළිබඳව නිවැරදිව ඉදිරිපත් කිරීමට අයදුම්කරුවන් උත්සාහ දරා නොමැත.

සමස්ථයක් ලෙස ගත් කළ ඉතා හොඳ කාලෝචිත ප්‍රශ්නයකි. විෂය දැනුම ඇති අයදුම්කරුවන්ට ඉතා පහසුවෙන් ඉතාම සුළු වේලාවකදී පිළිතුරු සපයා සම්පූර්ණ ලකුණු ලබාගත හැකිව තිබුණි. අනෙක් ප්‍රශ්න හා සාපේක්ෂව බලන කළ සම්පූර්ණයෙන්ම පාහේ විෂය දැනුම පිළිබඳ විමසා ඇති හෙයින් අයදුම්කරුවන් මෙම ප්‍රශ්නය අතහැර දමා ඇති බව පෙනේ.

**ප්‍රශ්න අංක 06 - ලකුණු 15**
**(තෝරා ගත හැකි ප්‍රශ්නයකි.)**

විද්‍යුත් තැපැල, ෆැක්ස් හා ටෙලිමේල් සම්බන්ධයෙන් සිසුන්ගේ දැනුම පිරික්සන ඉතාමත් කාලෝචිත හා පහසු ප්‍රශ්නයක් වශයෙන් මෙය හැඳින්විය හැක.

(A) ෆැක්ස් හා ඊමේල් අතර සමානකම් විමසා තිබුණු මෙම කොටසට ළමයින් ඉතා හොඳින් පිළිතුරු සපයා ලකුණු ලබාගෙන තිබුණි.

(B) ෆැක්ස් හා ඊමේල් අතර අසමානකම් විමසා තිබුණු මෙම කොටසට ද ඉතාමත් හොඳින් පිළිතුරු සපයා මුළු ලකුණු ලබා ගැනිමට සමත්ව තිබුණි.

(C) විද්‍යුත් තැපෑලේ ආගමනයත් සමග ෆැක්ස් භාවිතය අභාවයට යනු ඇතිද යන්න විමසා තිබුණු මෙම කොටසට ඉතාමත් හොඳින් සිසුන් පිළිතුරු සපයා තිබුණු නමුත් සමහර අයදුම්කරුවන් එකඟ වීම හෝ නොවීම පමණක් සඳහන් කර එය නිවැරදිව සාධාරණීකරණය කර නොතිබුණි.

(D) ටෙලිග්‍රෑම් සේවය නවතා ඒ වෙනුවට තැපැල් දෙපාර්තමේන්තුව විසින් හඳුන්වා දුන් ටෙලිමේල් සම්බන්ධයෙන් විමසා තිබුණු මෙම කොටසට සිසුන්ගේ පිළිතුරු සැපයීම තරමක් දුරට අසාර්ථක වී තිබුණි. මන්ද බොහොමයක් සිසුන් ටෙලිමේල් ගැන නොදැන සිටීම එයට හේතුවයි. නොයෙක් දෙනා ඒ සම්බන්ධයෙන් වැරදි වැටහීමක් ලබාගෙන විද්‍යුත් තැපැල ගැන සඳහන් කර තිබුණි.

**ප්‍රශ්න අංක 07 - ලකුණු 15**
**(තෝරා ගත හැකි ප්‍රශ්නයකි.)**

විමසා ඇති කරුණු - විද්‍යුත් වාණිජ්‍යය භාවිතා කිරීමේ වාසි, විද්‍යුත් වාණිජ්‍යය ක්‍රමයේ අවාසි, මූලාකෘති ක්‍රමය යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද යන්න.

මෙම ප්‍රශ්නයේ (a) හා (b) කොටසට ඉතා හොඳින් බොහෝ අයදුම්කරුවන් පිළිතුරු සපයා තිබුණි.

(c) කොටස සඳහා පැහැදිලි කිරීම් වෙනුවෙන් ලකුණු ලබාගෙන ඇත්තේ කිහිප දෙනෙක් පමණි. Prototype යන අදහස නිශ්චිතව පැහැදිලි කිරීමට බොහෝ දෙනෙකුට නොහැකි විය. එබැවින් එය අනුමාන කොට ලියා තිබීම දැකිය හැකි විය.

**විභාග අයදුම්කරුවන්ගේ සාධන මට්ටම දියුණු කර ගැනීම සඳහා සැලකිල්ල යොමු කළ යුතු පොදු කරුණු:**

1. පිළිතුරු සැපයීමට පෙර ප්‍රශ්නය හොඳින් කියවා නිවැරදිව වටහාගෙන අසා ඇති දෙයට පමණක් පිළිතුරු සැපයිය යුතුය.
2. සිසුන්ට එක් එක් ක්ෂේත්‍රවල තාක්ෂණික වචන පිළිබඳව හා ඒවායේ වෙනස්කම් පිළිබඳ මනා වැටහීමක් තිබිය යුතුය.
3. තොරතුරු තාක්ෂණය සම්බන්ධ ගැටළු වලට පිළිතුරු ලිවීමේදී අළුතින් නිකුත් කරන සඟරා, පුවත්පත්, අත්පොත්, පාඨ ග්‍රන්ථ හා අන්තර්ජාලය හොඳින් පරිශීලනය කර නිරන්තරයෙන් අධ්‍යයනය කළ යුතු වේ
4. විශේෂයෙන් තොරතුරු තාක්ෂණයේ නව ප්‍රවණතා සම්බන්ධව දැනුම යාවත්කාලීන කර ගැනීම.
5. තොරතුරු තාක්ෂණයේ න්‍යායාත්මක කරුණු ප්‍රායෝගිකව ක්‍රියාත්මක කරන ආකාරය පැහැදිලිව දැන සිටීම.
6. විශේෂයෙන්ම, බහුවරණ කොටස සඳහා පිළිතුරු සැපයීමේදී නිවැරදි ප්‍රශ්න අංක (ඉංග්‍රීසි අක්ෂරයන්) පිළිවෙලින් උත්තර පොතේ සඳහන් කර එම ප්‍රශ්න වල උත්තරයන්ට අදාල ඉලක්කම පැහැදිලිව දැක්විය යුතුය (අනුපිළිවෙලට A සිට T දක්වා ප්‍රශ්න අංක යෙදීම).
7. අළුත් ප්‍රශ්නයක් අළුත් පිටුවකින් ආරම්භ කළ යුතුය.
8. අත් අකුරු පැහැදිලිව ලිවිය යුතුය.
9. උත්තර පත්‍ර භාර දීමට පෙර විභාග ශාලාවේදී ප්‍රශ්න අංක හා තමන්ගේ විභාග අංකය නිසිපරිදි යොදා ඇත්දැයි පරීක්ෂා කර බැලීම.
10. විභාගයට පෙර සූදානමක් සහිතව පසුගිය ප්‍රශ්නපත්‍ර පරිශීලනය කිරීම හා ඒඒටී ආයතනය නිකුත් කර ඇති ස්වඅධ්‍යයන පාඨමාලා පොත (Study Pack) හොඳින් අධ්‍යයනය කිරීම.

- * * * -